# සංචාරක ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන ඇමෙරිකානු හා චීන ජාතික සංචාරකයන් පිළිබඳ අධ්‍යයනයක්

ජේ.එම්.සී.බී. ජයසුන්දර*

සංචාරක කර්මාන්තයේ දී පුද්ගලයා හා සංචරණය ප්‍රධාන අංශද්වය වන අතර ලෝකයේ රටවල් බහුතරයක ප්‍රමුඛතා කර්මාන්තයක් බවට මෙය පත්ව ඇත. එමඟින් සංචාරක කර්මාන්තයේ නියැලෙන රටවල් විශේෂයෙන් ආර්ථික අභිවෘද්ධියක් අපේක්ෂා කරනු ලබයි. දකුණු ආසියාවේ ප්‍රචලිතව පවතින සංචාරක ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාවට විවිධ රටවලින් සංචාරකයින් පැමිණීම පෙන්වාදිය හැකිය. විශේෂයෙන්ම ඇමෙරිකාව හා නැගෙනහිර ආසියාතික රටක් වන චීනය යන රටවලින් පැමිණෙන සංචාරකයන් හට ප්‍රමුඛ ස්ථානයක් හිමිවේ. ඒ මක්නිසා ද යත් ශ්‍රී ලංකාවට සංචාරකයන් පැමිණෙන රටවල් අතර උක්ත රටවල් දෙක ඉහළ ස්ථානයක් නියෝජනය කරන බැවිනි. ඒ බව සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන වාර්තාවලින් සනාථ වේ. සංචාරකයෙක් තම වාසස්ථානයෙන් වෙනත් සංචාරක ගමනාන්තයක් වෙත ගමන් කිරීම සඳහා, බලකරන කරුණු (Push Factors) සහ ආකර්ෂණ කරුණු (Pull Factors) ඍජුව බලපායි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවට පැමිණෙන ඇමෙරිකානු හා චීන ජාතික සංචාරකයන් කෙරෙහි මුඛ්‍ය අවධානය යොමු කරමින් ඔවුන් පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යනයක් සිදු කිරීමයි. උක්ත රටවල වෙසෙන පුද්ගලයන් විවිධ හේතූන් නිසා ස්වකීය ජීවිතය ආස්වාදනය කර ගැනීම සඳහා සංචරණයට පෙළඹෙයි. මෙසේ සංචරණය කිරීම හේතුවෙන් නව සංචාරක නිෂ්පාදන බිහිවීම සුලභව දැකගත හැකිය. මෙම අධ්‍යයනයේ දී ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් සංචාරක කර්මාන්තය පිළිබඳව ලියවී ඇති කෘතීන් ද ද්විතීක මූලාශ්‍ර වශයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) විසින් නිකුත් කරනු ලබන වාර්තා සහ තද් විෂය පිළිබඳ අනුදත් පුද්ගලයන් සමග කරනු ලබන සම්මුඛ සාකච්ඡා ද උපයෝගී කරගනු ලබයි.

ප්‍රමුඛ පද - සංචරණය, සංචාරක කර්මාන්තය, බලකරන කරුණු (Push Factors), ආකර්ෂණ කරුණු (Pull Factors), සංචාරක නිෂ්පාදන.

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය chamikarajayasundara1@gmail.com